කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2024

2026 - මැයි

**BCOME 3035 - උසස් මූල්‍ය ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : (තුනයි ) 03 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක - 01**

2025.04.01 දින සෙයින් ලිමිටඩ් සමාගම විසින් කෙයින් ලිමිටඩ් සමාගමේ ශුද්ධ වත්කම්වලින් 80% ක් අත්පත් කර ගන්නා ලදී. අත්පත් කර ගැනීමේ දිනට පාලනය අහිමි කොටස් හිමියන්ගේ (NCI) සාධාරණ අගය රු. 1,250,000 ක් විය. 2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සෙයින් සමූහ ව්‍යාපාරයේ තනි මූල්‍ය ප්‍රකාශන පහත දැක්වේ.

2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තීරණ ආදායම් ප්‍රකාශන

| | සෙයින් ලිමිටඩ් (රු) | කෙයින් ලිමිටඩ් (රු) |
|---|---|---|
| ආදායම | 2,150,000 | 1,245,000 |
| විකුණුම් පිරිවැය | (1,520,000) | (820,000) |
| දළ ලාභය | 630,000 | 425,000 |
| ලාභාංශ ආදායම | 92,500 | 7,200 |
| පරිපාලන වියදම් | (150,000) | (45,000) |
| බෙදාහැරීමේ වියදම් | (105,000) | (18,000) |
| මෙහෙයුම් ලාභය | 467,500 | 369,200 |
| මූල්‍ය වියදම් | (15,000) | (6,500) |
| බදු පෙර ලාභය | 452,500 | 362,700 |
| බදුකරණය | (68,000) | (54,000) |
| වර්ෂයේ ලාභය | 384,500 | 308,700 |

2026 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන

| | සෙයින් ලිමිටඩ් (රු) | කෙයින් ලිමිටඩ් (රු) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6,000,000 | 4,200,000 |
| රඳවාගත් ලාභය | | |
| 2025.04.01 දිනට ශේෂය | 2,900,000 | 1,050,000 |
| ශුද්ධ ලාභය | 384,500 | 308,700 |
| ගෙවන ලද ලාභාංශ | (84,500) | (108,700) |
| | 3,200,000 | 1,250,000 |
| 2026.03.31 දිනට ශේෂය | 9,200,000 | 5,450,000 |

2026 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන

| | සෙයින් ලිමිටඩ් (රු) | කෙයින් ලිමිටඩ් (රු) |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3,200,000 | 3,450,000 |
| කෙයින් හි ආයෝජනය | 4,500,000 | |
| වෙනත් ආයෝජන | 850,000 | 920,000 |
| | 8,550,000 | 4,370,000 |
| ජංගම වත්කම් | | |
| තොග | 650,000 | 720,000 |
| වෙළඳ ණයගැතියෝ . | 280,000 | 340,000 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් | 25,000 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 60,000 | 190,000 |
| | 1,015,000 | 1,250,000 |
| මුළු වත්කම් | 9,565,000 | 5,620,000 |
| හිමිකම සහ වගකීම් | | |
| හිමිකම | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 6,000,000 | 4,200,000 |
| රදවාගත් ලාභය | 3,200,000 | 1,250,000 |
| | 9,200,000 | 5,450,000 |
| ජංගම නොවන වගකීම් | | |
| පොලී සහිත ණය ලබාගැනීම් | 120,000 | 70,000 |
| | | |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ණයහිමියෝ | 235,000 | 72,000 |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් | | 20,000 |
| බදු | 10,000 | 8,000 |
| | 245,000 | 100,000 |
| මුළු හිමිකම සහ වගකීම | 9,565,000 | 5,620,000 |

අතිරේක තොරතුරු

1. වර්ෂය තුළ සෙයින් ලිමිටඩ් විසින් රු. 120,000 ක් වටිනා භාණ්ඩ පිරිවැය මත 20% ක ලාභාංශයක් සහිතව කෙයින් ලිමිටඩ් වෙත විකුණා ඇත. වර්ෂ අවසානයේදී මෙම භාණ්ඩවලින් 30% ක් කෙයින් ලිමිටඩ් හි අවසාන තොගයේ ඉතිරිව තිබුණි

2. කෙයින් ලිමිටඩ් විසින් රු. 40,000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 55,000 කට සෙයින් ලිමිටඩ් වෙත විකුණා ඇත. වර්ෂ අවසානයේදී මෙම භාණ්ඩවලින් 25% ක් සෙයින් ලිමිටඩ් හි අවසාන තොගයේ ඉතිරිව තිබුණි.

3. ජංගම ගිණුම් ශේෂයන්හි වෙනස ඇතිවූයේ 2026.03.28 දින සෙයින් ලිමිටඩ් විසින් කෙයින් ලිමිටඩ් වෙත කරන ලද ගෙවීමක් කෙයින් ලිමිටඩ් විසින් වාර්තා කර නොතිබීම හේතුවෙනි.

4. කෙයින් ලිමිටඩ් හි වෙළඳ ලැබිය යුතු දෑ තුළ සෙයින් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු රු. 18,000 ක් ඇතුළත් වේ

ඔබ විසින් පහත දෑ පිළියෙල කළයුතුය

අ) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සෙයින් සමූහයේ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය

(ලකුණු 15)

ආ) 2026.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සෙයින් සමූහයේ ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(ලකුණු 06)

ඇ) 2026.03.31 දිනට සෙයින් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

(ලකුණු 19)

**(මුළු ලකුණු 40යි)**

**ප්‍රශ්න අංක. 02**

පහත දැක්වෙන්නේ 2026.03.31 දිනට නිසල ඉන්ඩස්ට්‍රිස් සමාගම ඇවර කිරීමට තීරණය කළ දින පවතින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයයි

නිසල ඉන්ඩස්ට්‍රිස්
**2026.03.31** දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| ඉඩම් | 5,800,000 | |
| ගොඩනැගිලි | 3,950,000 | |
| යන්ත්‍ර සූත්‍ර | 2,250,000 | |
| උපකරණ | 2,132,500 | 14,132,500 |
| ජංගම වත්කම් | | |
| තොග | 1,020,000 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 1,120,000 | |
| කලින් කල වියදම් | 200,000 | |
| මුදල් | 18,000 | |
| **මුළු වත්කම්** | | 2,358,000 |
| | | **16,490,500** |
| කොටස් සහ වගකීම් | | |
| ප්‍රාග්ධනය | | |
| කොටස්120,000 (රු.100 බැගින්) | 12,000,000 | |
| හිඟ ඇරයුම් (කොටස් හිමියන් 2000 කින් රු. 30 බැගින්) | (60,000) | |
| සම්පූර්ණයෙන්ම ගෙවා ඇති 15%, රු. 100 බැගින් වූ වරණීය | 1,000,000 | |
| කොටස් 80,000 | (3,010,000) | |
| සංචිත | | 9,930,000 |
| ජංගම නොවන වගකීම් | | |
| 12%, රු. 100 ණයකර | 150,000 | |
| ඉඩම් උකස් කිරීම මත ණය | 3,000,000 | |

| | | |
|---|---|---|
| ගොඩනැගිලි උකස් කිරීම මත ණය | 2,400,000 | |
| | | 5,550,000 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියන් | 310,000 | |
| ගෙවිය යුතු වරණිය කොටස් ලාභාංශ | 275.000 | |
| උපචිත අධ්‍යක්ෂවරයාගේ වැටුප | 140,000 | |
| වැටුප් සහ වේතන (මාස 05) | 275,000 | |
| ආදායම් බද්ද | | |
| 2023/24 | 6,000 | |
| 2024/25 | 2,800 | |
| 2025/26 | 1,700 | |
| මුළු ප්‍රාග්ධනය සහ වගකීම් | | 1,010,500 |
| | | 16,490,500 |

i. 2026 අප්‍රේල් 2 වන දින සමාගම අධිකරණයෙන් ඈවර කිරීමේ නියෝගයක් ලබා ගත් අතර, සමාගමේ ලේකම් විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 283 වගන්තිය අනුව සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශය (Statement of company affairs) 2026 මැයි 2 දින ඉදිරිපත් කරන ලදී

ii. වත්කම් පහත පරිදි අගය කර උපලබ්ධි කර ගන්නා ලදී
  - ඉඩම් - රු. 6,250,000
  - ගොඩනැගිලි - රු. 3,410,000
  - තොග - රු. 980,000

iii. වෙළඳ ලැබිය යුතු දෑ වර්ගීකරණය:
  - යහපත් රු. 500,000
  - සැක සහිත (50% ක් ලැබෙනු ඇතැයි අපේක්ෂිත) රු. 500,000
  - බෝල් ණය රු. 120,00

iv. පෙරගෙවුම් වියදම් අත්තිකාරම් රක්ෂණයට අදාළ වන අතර, එයින් රු. 100,000 ක් ආපසු ලැබේ

v. හිග ඇරයුම් වලින් රු. 50,000 ක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

vi. නෛතික හිමිකම් පෑමක් සම්බන්ධයෙන් රු. 60,000 ක අසම්භාව්‍ය වගකීමක් පවතින අතර එය රු. 50,000 කින් පියවීමට අපේක්ෂා කෙරේ

vii. වෙළඳ ණයහිමියන් රු. 290,000 ක් ලෙසද අධ්‍යක්ෂ පාරිශ්‍රමික රු. 120,000 ක් ලෙසද පියවීමට අපේක්ෂා කෙරේ

viii. 2023.04.01 දින සමාගම සතුව පහත ශේෂ පැවතුනි :
  - රඳවා ගත් ඉපැයීම් - රු. 40,000
  - සාමාන්‍ය සංචිතය - රු. 55,000
  - ප්‍රකාශිත ලාභාංශ - රු. 600,000

  2023/24 වර්ෂය තුළ:
  - සමාගමට රු. 350,000 ක වෙළඳ අලාභයක් සිදුවිය

· තොග හානිය හේතුවෙන්අ ලාභය රු. 150,000 කි

2024/25 වර්ෂය තුළ:

· සමාගම රු. 700,000 ක වෙළඳ අලාභයක් දරන ලදී

2025/26 වර්ෂය තුළ:

· සමාගමට රු. 1,305,000 ක අලාභයක් දරන ලදී.

ඉහත තොරතුරු භාවිතා කිරීමෙන්, ඔබ විසින්,

අ) සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශන

(ලකුණු 22)

ආ) ඌනතා හෝ අතිරික්ත ගිණුම

(ලකුණු 13)

**(මුළු ලකුණු 35)**

ප්‍රශ්න අංක. **03**

අ). i. මූල්‍ය තොරතුරු සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදු වුවද, සංවිධාන සෑම විටම උසස් තත්ත්වයේ මූල්‍ය වාර්තා නිෂ්පාදනය කිරීමට අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවය පවතින්නේ මන්දැයි පැහැදිලි කර මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට එහි වැදගත්කම සාධාරණීකරණය කරන්න

(ලකුණු 04)

ii. මූල්‍ය වාර්තාකරණය සඳහා සංකල්පීය රාමුවට අනුව අයිතමයක් මූල්‍ය වාර්තා වල හඳුනාගැනීම හා ඉවත්කිරීමේ නිර්ණායක පැහැදිලි කරන්න

(ලකුණු 04)

iii. මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පීය රාමුවේ දක්වා ඇති පරිදි ප්‍රයෝජනවත් මූල්‍ය ප්‍රකාශනවල ගුණාත්මක ලක්ෂණ නම් කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) i. ව්‍යාපාර සංයෝජනයක පාලනය අහිමි පිරිවැය (Non-Controlling Interest) යනු කුමක්ද?

(ලකුණු 03)

ii. SLFRS 3 ට අනුව ව්‍යාපාර සංයෝජනයක කීර්තිනාමය ගණනය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 25)**